# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2415/55 - 2024 දෙසැම්බර් මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2024.12.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත (420 වන අධිකාරය)**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවෙ හි 2 වන අනු ව්‍යවස්ථාව සමග කියවිය යුතු ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතෙ හි (420 වැනි අධිකාරය) 2 වැනි වගන්තිය, 5 වැනි වගන්තිය සහ 21C වැනි වගන්තිය සමග කියවිය යුතු 55 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

අනුර කුමාර දිසානායක,
ජනාධිපති.

2024 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

2024 නොවැම්බර් මස 25 වන දින පැවති අංක MF/LA/022/CM/2024/090 දරන අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (ජනරජය) රාජ්‍ය ණය තිරසාරභාවය සහතික කිරීම සඳහා ජනරජයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීම සිදුවිය යුතු බවට අනුමත කරන ලද අතර, ඒ තුළින් ආර්ථිකය කඩිනමින් යථාතත්වයට පත් කිරීම හරහා, ශ්‍රී ලංකාවේ ජනතාවට සහ අනාගත පරම්පරාවන්ට ප්‍රතිලාභ ගෙන දෙන තිරසාර ආර්ථික වර්ධනයක් සුරක්ෂිත කිරීම වෙනුවෙන්, අදාළ නීති යටතේ ජාත්‍යන්තර ස්වෛරී ණය ප්‍රතිව්‍යුහගත කිරීම ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සියලු අනුමැතීන් ලබා දෙන ලදී.

1937 අංක 07 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතේ 55 වන වගන්තිය සමග කියවිය යුතු 2 වන වගන්තිය, 5 වන වගන්තිය සහ 21C වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන විෂයය භාර අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, පහත රෙගුලාසි සම්පාදනය කරමි.

නියෝග

1. මෙම නියෝග 2024 අංක 1 දරන "ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමේ දී ශ්‍රී ලංකා රුපියල් වටිනාකම් සහිත සුරැකුම්පත් නිකුත් කිරීම මගින් දේශීය විකල්පය ක්‍රියාත්මක කිරීම)" නියෝග ලෙස දැක්විය හැකිය.


1A - G 43344 — 05 (2024/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සහ රාජ්‍ය ණය ලේඛකාධිකාරීවරයා වෙත මම මෙයින් ප්‍රකාශ කර බලය පවරමි :-

2.1. ජනරජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අංක MF/LA/022/CM/2024/090 දරන අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද 2024 නොවැම්බර් 25 දිනැති "ස්වෛරීත්ව ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම ක්‍රියාත්මක කිරීම" පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශයේ සහ අමුණා ඇති 2024 නොවැම්බර් 25 දිනැති ආරාධනා පත්‍රිකාවේ වඩාත් විස්තරාත්මකව දක්වා ඇති පරිදි නව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මගින් දේශීය විකල්පය (මෙතැන් සිට "දේශීය විකල්පය" ලෙස හැඳින්වේ) ක්‍රියාත්මක කිරීම;

2.2. ඉහත රෙගුලාසි 2.1 යටතේ ප්‍රකාශ කර අවසර දී ඇති පරිදි දේශීය විකල්පය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයක් ආඥාපනත යටතේ සකස් කර නිකුත් කිරීම, සහ

2.3. මෙම ආඥාපනතේ හෝ වෙනත් ඕනෑම පනතක විධිවිධාන යටතේ වෙළෙඳපොළ පදනම් නොවන යාන්ත්‍රණයක් මගින් දේශීය වෙළෙඳපොළේ භාණ්ඩාගාර බැඳුම්කර සකස් කර නිකුත් කිරීම.

3. ආඥාපනතට යටත්ව දේශීය විකල්පය ක්‍රියාත්මක කිරීමේ දී නිකුත් කිරීමට නියමිත නව භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ විස්තරය, සුරැකුම්පත් හිමියන්ගේ කාණ්ඩය, සුරැකුම්පත් හිමියාගේ නිශ්චිත තොරතුරු, පොලී ගෙවීම සහ වෙනත් ගෙවීම් සිදුකළ යුතු ආකාරය සහ එවැනි භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කළ හැකි කොන්දේසි පිළිබඳ නිශ්චිත තොරතුරු රාජ්‍ය ණය ලේඛකාධිකාරීවරයාට සඳහන් කිරීමට මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාට මම මෙයින් බලය පවරමි.

4. ඉහත 2 වන සහ 3 වන නියෝග යටතේ මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් භාණ්ඩාගාර බැඳුම්කර ආඥාපනත යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි අරමුදල් සම්පාදනයකින් තොරව සකස්කර නිකුත් කිරීමට රාජ්‍ය ණය ලේඛකාධිකාරීවරයා වෙත මෙයින් තවදුරටත් බලය පවරමි.

5. ශ්‍රී ලංකාවේ රජය වෙනුවෙන් ඉහත සඳහන් කළ දේශීය විකල්පය බලාත්මක කිරීමට ලංකා සෙක්‍යුවර් සිස්ටම් හි මධ්‍යම තැන්පතු පද්ධතියේ (Central Depository System of Lanka Secure System) හෝ වෙනත් අදාළ ආයතනයක ගිණුම් එකක් හෝ කිහිපයක් විවෘත කිරීමට, පවත්වාගෙන යාමට, හුවමාරු ක්‍රියාත්මක කිරීමට සහ වසා දැමීමට මම රාජ්‍ය ණය ලේඛකාධිකාරීවරයාට මෙයින් බලය පවරමි.

6. මම මෙයින් රාජ්‍ය ණය ලේඛකාධිකාරීවරයා පත් කරමි:

6.1. මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි ඉහත සඳහන් කළ දේශීය විකල්පය බලාත්මක කිරීම සඳහා දේශීය ධාරණ කාල භාරකරු (Local Holding Period Trustee) ලෙස ක්‍රියා කිරීමට, සහ

6.2. මේ සම්බන්ධව සහ/හෝ ආනුෂංගිකව යම් කාර්යයක් ඉටු කිරීමට:

6.2.1. දේශීය විකල්පය යටතේ කිසිදු හිමිකරුවෙකුට නිකුත් නොකළ සුරැකුම්පත්, කිසිදු අනුරූපී අරමුදල් පියවීමකින් තොරව, ලංකා සෙක්‍යුවර් සිස්ටම් හි මධ්‍යම තැන්පතු පද්ධතියේ (Central Depository System of Lanka Secure System) පවත්වාගෙන යනු ලබන විශේෂ සුරැකුම්පත් ගිණුමකට භාර ගිණුමක් ලෙස මාරු කිරීම,

6.2.2. ඉහත 6.2.1. රෙගුලාසි යටතේ තබා ඇති සුරැකුම්පත්වල කූපන් හෝ කල්පිරීම් සඳහා ලැබිය යුතු මුදල් පරිපාලනය කිරීම සහ එම කාර්යය සඳහා විශේෂයෙන් නම් කරන ලද ගිණුමක් යටතේ පවත්වාගෙන යෑම, සහ

6.2.3. මාරු කිරීම:

6.2.3.1. ඉහත රෙගුලාසි 6.2.1 හි සඳහන් පරිදි විශේෂ සුරැකුම්පත් ගිණුමේ පවත්වාගෙන යනු ලබන එවැනි භාණ්ඩාගාර බැඳුම්කර කිසිදු අනුරූපී අරමුදල් පියවීමකින් තොරව අදාළ හිමිකරුවන්ට, සහ

6.2.3.2. ඉහත රෙගුලාසි 6.2.2 හි නිශ්චිතව දක්වා ඇති පරිදි පවත්වාගෙන යනු ලබන එවැනි අනුරූප අරමුදල්,

මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් නිශ්චිත උපදෙස් ලැබුණු විට මාරු කිරීම.

7. මෙම රෙගුලාසි මගින් අවසර දී ඇති පරිදි භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සහ සකස් කිරීමේ දී දරනු ලබන ඕනෑම වියදමක් ගෙවීම සඳහා ආඥාපනත යටතේ අවශ්‍ය භාණ්ඩාගාර බැඳුම්කර සකස් කර නිකුත් කිරීමට මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ රාජ්‍ය ණය ලේඛකාධිකාරීවරයාට මම මෙයින් බලය පවරමි.

EOG 12 - 0237

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.